# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2006 අංක 31 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2006 සැප්තැම්බර් මස 26 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2006 සැප්තැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 5.50 යි.　　තැපැල් ගාස්තුව : රු. 5.00 යි

## 2006 අංක 31 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 සැප්තැම්බර් මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 43/2006.

### (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 31 දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 45 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 351 වන අධිකාරයේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ "(උ) ඡේදය යටතේ වූ වරදක්" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ වචන වෙනුවට "(උ) ඡේදය හෝ (ඌ) ඡේදය හෝ (එ) ඡේදය හෝ (ඒ) ඡේදය හෝ (ඔ) ඡේදය හෝ (ඕ) ඡේදය හෝ (ක) ඡේදය හෝ (ග) ඡේදය සහ (ච) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 45ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 45ඇ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 45ඇ වගන්තිය ඇතුළත් කිරීම.

"ශ්‍රී ලංකාව හැරයාමට තැනැත්තන්ට පහසුකම් සැලසීම.

45ඇ. (1) (අ) මේ පනතේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩකරමින් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව හැර යාමට සංවිධානය කරන ;

(ආ) (අ) ඡේදය යටතේ එසේ සංවිධානය වීමට උත්සාහ කරන හෝ සංවිධානය වීමට සූදානම් වීමක් වශයෙන් යම් ක්‍රියාවක් සිදු කරන හෝ එසේ සංවිධානය වීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර සහ අනුබල දෙන,

යම් තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී එක් අවුරුද්දකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ "සංවිධානය" යන යෙදුමට, එහි ව්‍යාකරණ වෙනස් කිරීම් සහිතව —

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාව ලබාදීමේ පොරොන්දුව සහිතව තැනැත්තකු බඳවා ගැනීම ;

(ආ) විදේශ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යාමට තැනැත්තන් පෙළඹවීමේ අදහසින් දැන දැනම විදේශ රටක රැකියා ලබාදෙන බවට ව්‍යාජ පොරොන්දු දීම හෝ කරුණු වැරදි ලෙස ඉදිරිපත් කිරීම හෝ නොමග යවන සුළු තොරතුරු ප්‍රචාරය කිරීම ;

(ඇ) යම් ප්‍රතිලාභයක් අත් වුව ද එසේ නැති වුව ද, තැනැත්තන්ගෙන් මුල්‍ය ප්‍රතිලාභ ඉල්ලා සිටීම ;

(ඈ) වලංගු ගමන් ලේඛන ලබා නොගෙන මුහුදින්, ගොඩබිමින් හෝ වෙනත් ආකාරයකින් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ දී හෝ යම් විදේශීය රටක දී තැනැත්තන් භාරගැනීම සහ ඔවුන්ට රැකවරණය දීම,

ඇතුළත් වේ.".

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) මේ පනතේ III වන කොටස අදාළ වන තැනැත්තන් විසින්—

(i) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය, (ආ) ඡේදය, (ඇ) ඡේදය, (ඈ) ඡේදය, (ඉ) ඡේදය, (ඊ) ඡේදය හෝ (උ) ඡේදය යටතේ ; සහ

(ii) 45 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය, (ආ) ඡේදය, (ඇ) ඡේදය, (ඈ) ඡේදය (ඉ) ඡේදය හෝ (උ) ඡේදය එම වරද සම්බන්ධයෙන් අදාළ වන තාක් දුරට 45 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ,

සිදු කරනු ලබන සෑම වරදක් ම.".

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 47අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 47අ වගන්තිය ඇතුළත් කිරීම.

"ඇප ලබාදීම.

47අ.(1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, 45ඈ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින කිසිම තැනැත්තකු විශේෂ අවස්ථානුගත කරුණු ඔප්පු කිරීමේ දී මහාධිකරණයක් විසින් හැර ඇප මත නිදහස් කරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සඳහා ඇප ලබාදීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශිත විධිවිධානයක් නොමැති අවස්ථාවක, ඇප ලබාදීම මහෙස්ත්‍රාත්වරයකු විසින් සිදු කළ යුතු ය.".

(3) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ විධිවිධාන අදාළ කර ගැනීමේ දී මේ වගන්තිය බලාත්මක වන දින වන විට රිමාන්ඩ් භාරයේ සිටින්නේ යම් තැනැත්තෙක් ද ඒ සෑම තැනැත්තෙක් වෙතම බලපැවැත්විය යුතු ය.".

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.